"බුද්ධි කලම්බනයක නවමු මග"

# ශ්‍රී ලංකා පරිපාලන සේවා

## විවෘත / සීමිත තරග විභාගය

## SLAS (OPEN / LIMITED)

4

**සුවිශේෂී සම්මන්ත්‍රණ මාලාව**

**2017 මාර්තු 04 සෙනසුරාදා බොරැල්ල YMBA හිදී**

**2017 මාර්තු 05 ඉරිදා බොරැල්ල කේරි විද්‍යාලයේදී**

**පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා**

අන්තර්ගතය


| | පිටු |
|---|---|
| ★ සාමාන්‍ය බුද්ධිය<br>SLAS / 2017/IQ/04 | 01-04 |
| ★ සාමාන්‍ය දැනීම<br>SLAS / 2017/GK/02 | 05-11 |
| ★ සාමාන්‍ය දැනීම - අමතර කියවීම<br>SLAS / 2016/GK/EX/03 | 12-13 |


දෛනික සම්පත් දායකත්වය

ප්‍රධාන ආරාධිත දේශිකා :

# අනූෂා ගෝකුළ ප්‍රනාන්දු මහත්මිය

ඇතුළු

ප්‍රවීණ ආචාර්ය මණ්ඩලයක්

**වැඩි විස්තර 0777 356968, 0716 364525**

Facebook - Exams.govnew

''බුද්ධි කලම්බනයක නවමු මග''

# ශ්‍රී ලංකා පරිපාලන සේවා විවෘත/ සීමිත තරග විභාගය

## සාමාන්‍ය බුද්ධිය

**සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන එක් එක් සංඛ්‍යා ශ්‍රේණියේ ඊළඟට යෙදිය යුතු සංඛ්‍යාව හඳුනාගෙන එය තිත් ඉරි මත ලියන්න.**

01. 0, 7, 26, 63, ? (............................)

02. 400, 396, 99, 96, 32, ? (............................)

03. 26, 33, 47, 68, 96, ? (............................)

04. (3,4)5 : (5, 12)13 : (18, 24) ? (............................)

05. 16, 80, 20, 60, 30, ? (............................)

- **පහත සඳහන් ඡේදය කියවා අංක 06 සිට 10 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු හෝ පිළිතුරට අදාළ අංකය තිත් ඉරි මත ලියන්න**

වසන්ත, කාන්ත, ප්‍රියන්ත, සමන්ත, ලලන්ත සහ ජයන්ත යන යහළුවන් හය දෙනාට පහත සඳහන් පරිදි පමණක් යම් යම් භාෂාවන් කථා කිරිමට හෝ තේරුම් ගැනීමට හැකියාව ඇත. වසන්තට ජපන් භාෂාව කථා කිරිමට හා තේරුම් ගැනීමට හැකි අතර ලලන්තට ජපන් හා ඉංග්‍රීසි භාෂා යන දෙකම කථා කිරීමටත් තේරුම් ගැනීමටත් පුළුවන. ජයන්තට ඉංග්‍රීසි භාෂාව කථා කිරීමටත් තේරුම් ගැනීමටත් හැකි අතර ප්‍රංශ හා ජර්මන් භාෂා කථා කිරීමට නොහැකි වුවත් තේරුම් ගැනීමට පිළිවන. ප්‍රියන්තට ජර්මන් භාෂාව තේරුම් ගැනීමට, කථා කිරිමටත් පිළිවන. සමන්තට ප්‍රංශ භාෂාව තේරුම් ගැනීමටත් කථා කිරීමටත් හැකි අතර ජර්මන් භාෂාව කථා කිරිමට නොහැකි නමුත් තේරුම් ගැනීමට පමණක් පිළිවන. කාන්තට ඉංග්‍රීසි භාෂාව කථා කිරීමටත් තේරුම් ගැනීමටත් පිළිවන් අතර ප්‍රංශ භාෂාව තේරුම් ගැනීමට පමණක් හැකිය.

06. මෙම කණ්ඩායමේ පුද්ගලයන් හය දෙනාගෙන් වැඩිම පුද්ගලයන් සංඛ්‍යාවක් තේරුම් ගැනීමට පුළුවන් තැනැත්තා නම් කරන්න.

07. මෙම කණ්ඩායමේ පුද්ගලයින් හය දෙනා අතරින් අඩුම පුද්ගලයින් සංඛ්‍යාවක් තේරුම් ගැනීමට හැකි තැනැත්තා නම් කරන්න.

08. සමන්ත හා ජයන්ත එකට සිටින විට පහත සඳහන් කුමන වගන්තිය/ වගන්ති සත්‍ය වේද ?

(අ) ජයන්ත සමග කථා කිරීමට සමන්තට හැකි අතර, ජයන්තට සමන්තව තේරුම් ගත හැකිය. එහෙත් ජයන්තට සමන්ත සමග කථා කළ නොහැකිය.

(ආ) ප්‍රියන්ත ඔවුන් දෙදෙනාට එකතු වේ නම්, ඔවුන් දෙදෙනාටම ප්‍රියන්තව තේරුම් ගත හැකි වෙතත් ප්‍රියන්ත සමග කථා කළ නොහැකිය.

(ඇ) සමන්ත හා ජයන්ත සමග වසන්ත එකතු වූ විට ඔවුන් තිදෙනාට එකට කථා බස් කිරීමට හැකි භාෂාවක් නොමැත.

(i) 'අ' පමණයි. (ii) 'ආ' පමණයි. (iii) 'අ' සහ 'ආ'පමණයි.
(iv) 'ආ' සහ 'ඇ' පමණයි. (v) 'අ', 'ආ' සහ 'ඇ' (............................)

09. සමන්ත කථා කරන දෑ වසන්තට තේරුම් කරදීම සඳහා පහත සඳහන් කවර පුද්ගලයින් එහි සිටිය යුතුද ?

(අ) ජයන්ත සහ ලලන්ත (ආ) කාන්ත සහ ලලන්ත (ඇ) ප්‍රියන්ත සහ ලලන්ත

(i) 'අ' පමණයි. (ii) 'ආ' පමණයි. (iii) 'ඇ'පමණයි.
(iv) 'අ' සහ 'ආ' පමණයි. (v) 'ආ', 'ඇ' පමණයි. (............................)

10. ප්‍රියන්ත කථා කරන දේ කාන්තට තේරුම් කර දීම සඳහා පහත සඳහන් කවර තැනැත්තා එතැන සිටිය යුතුද?

(i) සමන්ත හෝ ලලන්ත (ii) සමන්ත හෝ ජයන්ත (iii) සමන්ත හෝ වසන්ත
(iv) ලලන්ත හෝ ජයන්ත (v) ලලන්ත හෝ වසන්ත (............................)

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට පදනම් වනුයේ මෙහි දැක්වෙන රූ සටහන්ය.**

**OABCDE** නම් වූ රූපයේ දැක්වෙන රේඛා 10 ට කිසිදු අනුපිළිවෙලක් නොමැතිව 1, 2, 3, 4, ..... 10 ආදි වශයෙන් අංක යොදා ඇත.




**OABCDE** නම් වූ සම්පූර්ණ රූපයේ සමහර කොටස මතු දැක්වෙන රූප මගින් දැක්වේ.




මෙම දත්ත ආශ්‍රයෙන් පහත දැක්වෙන රේඛාවලට අදාළ අංක තිත් ඉරි මත ලියන්න.

11. OD = (............................)
12. OC = (............................)
13. AE = (............................)
14. BC = (............................)
15. OE = (............................)

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට අදාළ පිළිතුර තෝරා වරහන් තුළ ලියන්න.**

16. පෙරහැර - 5214 පෙරළිය - 8638 කලිසම් - 7168
ලියකම් (i) 8678 (ii) 7581 (iii) 5174 (iv) 4516 (.......................)

17. සුවහස් - 8169 පෙහෙවස් - 2774 යනාදිය - 9582
සුනාමිය (i) 8547 (ii) 0541 (iii) 4570 (iv) 3489 (.......................)

18. බලවත් - 6218 බවලත් - 1375 මහසත් - 5731
සවිමත් (i) 6175 (ii) 4186 (iii) 4757 (iv) 2752 (.......................)

19. කගපත් - 1684 අතපත් - 1653 අපසිත් - 6714
අසිපත් (i) 2764 (ii) 2617 (iii) 1364 (iv) 6184 (.......................)

20. දහවල - 6457 මහබල - 3415 මදහස - 1275
වසලයා (i) 3872 (ii) 3841 (iii) 7518 (iv) 6574 (.......................)

21. දිග පළල මෙන් තුන් ගුණයක් වූ ගෙමිදුලක් වටා ඇතුළතින් අඩි 2 ක් පළල බොරලු තීරුවක් අතුරා ඇත. බොරලු තිරුවේ වර්ග ප්‍රමාණය වර්ග අඩි 176 කි. ගෙමිදුලේ ක්ෂේත්‍රඵලය වර්ග අඩි කීයද ?

(...................................)

22. දිග පළල මෙන් දෙගුණයක් වූ මල් පාත්තියක් වටා පිටතින් අඩි 1 ක් පළල පිඩෙලි තීරුවක් අල්ලා ඇත. පිඩෙලි තීරුවේ වරගඵලය වර්ග අඩි 40 කි. මල් පාත්තියේ ක්ෂේත්‍රඵලය වර්ග අඩි කීය ද?

(...................................)

- **අංක 23 සිට 26 ප්‍රශ්න ඡේදය කියවා විසඳන්න.**

හිරන්ත, සමන්ත, ප්‍රියන්ත සහ ජයන්ත මිතුරන්ය. ඔවුහු ගුරුවරයෙක්, වෛද්‍යවරයෙක්, නීතිඥයෙක් සහ ඉංජිනේරුවෙක්ද වෙති. එහෙත් එම පිළිවෙලින් නොවේ. ඔවුන් අතුරින් එක් අයෙකුට කාරයක් අයිති අතර, තවකෙකුට තේ වත්තක්ද, තවකෙකුට පොල් වත්තක්ද, අනෙකාට නිවසක්ද අයත් විය. ජයන්ත හා ප්‍රියන්ත නීතිඥයා හෝ ඉංජිනේරුවා නොවන අතර, වතුහිමියන් නොවූ හ. සමන්ත ඉංජිනේරුවා නොවන අතර, ඔහු කුළී නිවසක වෙසෙයි. නීතිඥයා පළමු වතාවට කාරයක් මිලදී ගැනීමට සොයමින් සිටියි. ඔහු හලාවත පිහිටි තම ඉඩමේ නිවසක් සාදමින්ද සිටියි. ජයන්ත වෛද්‍යවරයා නොවන අතර ඔහුට නිවෙසක්ද නොමැති නම්,

23. ජයන්තගේ වෘත්තිය කුමක්ද ?

24. නිවස හිමියාගේ වෘත්තිය කුමක්ද ?

25. සමන්තගේ වෘත්තිය කුමක්ද ?

26. ඉංජිනේරුවා කවුද ?

27. ඔරලෝසුවක පෙ.ව. 10.00 ත් 11.00 ත් අතර පැය කටුව සහ විනාඩි කටුව එක කෙලින් පිහිටන්නේ කීයටද ?

28. සංඛ්‍යාවකින් 3/4 එහි 2/3 ට වඩා 7 කින් අඩු සංඛ්‍යාව කීයද ?

29. කේක් ගෙඩියක බර එහි බරින් දශම 6 ක් සහ තවත් ග්‍රෑම් 400 ක් නම්, කේක් ගෙඩියේ බර කොපමණද ?

30. එක්තරා භාණ්ඩයක් නිෂ්පාදනය සඳහා යන්ත්‍ර දෙකක් යොදා ගනී. නමුත් මෙම යන්ත්‍ර දෙකේ නිෂ්පාදන වේගය සමාන නොවේ. එක් යන්ත්‍රයක් නිෂ්පාදනය කරන ප්‍රමාණයෙන් 1/3, අනිත් යන්ත්‍රය නිෂ්පාදනය කරන ප්‍රමාණයෙන් 1/2 කට සමානය. යන්ත්‍ර දෙකම දිනකදී නිපදවන භාණ්ඩ ගණන 9000 ක් නම්. වැඩි වේගයෙන් නිෂ්පාදනය කරන යන්ත්‍රය දිනකට නිෂ්පාදනය කරන භාණ්ඩ ගණන කොපමණද ?

31. පැත්තක් අඟල් 6ක් බැගින් වූ ඝනකයක විකර්ණ ඔස්සේ ප්‍රතිවිරුද්ධ දෙකෙළවරින් පැත්තක් අඟලක් බැගින් වූ ඝනක දෙකක් කපා ඉවත් කරන ලදී. දැන් ඝනකයේ දාර කීයද ?

32. එකී ඝනකයේ දාරවල සම්පූර්ණ දිග කොපමණද ?

- **පිළිවෙලින් අඟල් 6, 5, 4 බැගින් දිග, පළල, උස වූ ඝනකයකි. එම ඝනකයේ පැති හයේම රතු පැහැති තීන්ත ආලේප කිරීමෙන් අනතුරුව පැතතක් අඟල් එක බැගින් වූ කුඩා ඝනකවලට කපා වෙන් කරන ලදි නම්,**

33. කපන ලද කුඩා ඝනක කීයද ?
34. පැති තුනක රතු පැහැති කුඩා ගණක කීයද ?
35. පැති දෙකක් රතු පැහැති කුඩා ඝනක කීයද ?
36. මෝසා මැපැරාටිම්නෝසාන් යන්නෙහි තේරුම කුමක්ද ?
37. ඉහත තොරතුරු අනුව, අම්මා පුතාට වැඩ පවරයි යන්න රහස් බසින් ලියන්න.

- **"කිසිම හොස්සෙක් මස්සෙක් නොවේ. ඇතැම් කොස්සන් මස්සන් වන අතර, කොස්සන් වන හොස්සන් ද ඇත. මේ තුන් වර්ගයම රොස්සන් ගණයට අයත් වේ."**

දී ඇති පාඨ අනුව පහත එක් එක් වාක්‍යය සත්‍ය නම්, (T) ලෙසද, අසත්‍ය නම් (F) ලෙසද, සැක සහිත නම්, (D) ලෙස ද, ලකුණු කරන්න.

38. **a** මස්සෙකි. එම නිසා ඔහු කොස්සෙක් විය නොහැක. (..........................)
39. **b** කොස්සෙක් නොවූවද, හොස්සෙක් වන මස්සෙක් වේ. (..........................)
40. කොස්සන් හෝ මස්සන් හෝ හොස්සන් හෝ නොවන අය නැත. (..........................)
41. **c** මස්සෙක් නොවන කොස්සෙක් නම්, හෝ හොස්සෙක් විය යුතුමය. (..........................)
42. **d** රොස්සෙක් වේ. එම නිසා ඔහු කොස්සෙක් වේ. (..........................)

43. **e** මස්සෙක් නොවන කොස්සෙක් වේ. එම නිසා හේ කොස්සෙක් ද නොවේ (..........................)
44. **f** රොස්සෙක් නොවේ. එම නිසා හේ මස්සෙක් ද නොවේ. (..........................)
45. මසසන් නොවන කොස්සන් සිටියා වුව ද රොස්සන් නොවන කොස්සන් නොමැත. (..........................)
46. **g** කොස්සෙක් නිසා ඔහු මස්සෙක් වන හොස්සෙක් වේ. (..........................)
47. **h** මස්සෙක් නිසා ඔහු හොස්සෙක් වන කොස්සෙක් වේ. (..........................)

- **කාර්යාලයක ලිපිකරුවෝ 7 දෙනෙක් ද, ලිපිකාරියෝ 4 ක්ද, සිටිති. තුන්වාරයකදී, තිදෙනෙක් කාර්යාලයෙන් පිටතට ගිය ද, පිටතට ගිය අය ආපසු නොපැමිණියේ නම්,**

48. පිටතට ගිය තිදෙනාම ලිපිකරුවන් වීමේ ප්‍රතිශතය සොයන්න.

49. පිටතට ගිය තිදෙනාම ලිපිකාරිනියන් වීමේ ප්‍රතිශතය සොයන්න.

50. පිටතට ගිය තිදෙනාගෙන් එක් අයෙකු පමණක් ලිපිකාරිනියක් වීමේ ප්‍රතිශතය සොයන්න.

51. පෙට්ටියක එකම තරමේ හා වර්ගයේ කළු බෝල 5ක්ද, සුදු බෝල 3ක්ද, ඇත. වෙනත් පෙට්ටියක එම වර්ගයේම සුදු බෝල 2 ක් ඇත. අහඹු ලෙස පළමු පෙට්ටියෙන් බෝලයක් ගෙන, දෙවැනි පෙට්ටියට ද, දෙවෙනි පෙට්ටියෙන් බෝලයක් ගෙන පළමු පෙට්ටියට ද දමනු ලැබේ. දැන් පළමු පෙට්ටියේ කළු බෝල 5 ක් තිබීමේ සම්භාවිතාවය සොයන්න.

52. නිල් පාට පෙට්ටියක් තුළ සුදු පබළු 5ක්ද, කළු පබළු 3ක්ද තිබේ. කහ පාට පෙට්ටියක් තුළ සුදු පාට පබළු 2 ක්ද, කළුපාට පබළු 3ක් ද තිබේ. පෙට්ටි දෙකේම ඇති පබළු එකම තරමේ ඒවා වේ. නිල් පාට පෙට්ටියෙන් පබළුවක් අහඹු ලෙස ගෙන කහ පෙට්ටියට දැමීමෙන් පසු කහ පෙට්ටියෙන් පබළුවක් අහඹු ලෙස ගෙන නිල් පෙට්ටියට දමනු ලැබේ. දැන් නිල් පෙට්ටියේ සුදු පබළු 5ක් ලැබීමේ සම්භාවිතාවය සොයන්න.

53. එක්තරා ආයතනයක සේවකයෙකුගේ ආරම්භක වාර්ෂික වැටුප රුපියල් 3600 කි. ඔහුගේ වැටුප වසරකට රු. 140 බැගින් වැඩිවේ. අවුරුදු දහහතකදී වැටුප් වශයෙන් ඔහුට ලැබුණු මුළු මුදල කොපමණද ?

54. පැත්තක් අඟල් 3 ක් වූ ඝනයක් පැති 5ක තීන්ත ගෑමෙන් පසු අඟල්වලට කපන ලදී. එහි දෙපැත්තක් පමණක් තීන්ත ගෑවුන කැබලි කීයක් තිබේද ?

55. අඩි 10ක් ගැඹුරු වලක සිටින ගොළුබෙල්ලෙක් දිවා කාලයේ අඩි 2ක් ඉහළට ගමන් කරන අතර, රාත්‍රි කාලයේදී අඩි 1ක් පහළට ලිස්සා යයි. වලෙන් ගොඩට ඒමට ගොළුබෙල්ලාට දින කීයක් ගතවේ ද?

56. අනිල්ගේ වයස ඔහුගේ වයසින් භාගයකට වඩා අවු. 20කින් වැඩිය. ඔහුගේ වයස කීයද ?

57. සුනිලා විවාහ වන විට ඇගේ වයස ජයන්තගේ වයසින් 3/4 ක් විය. දැන් සුසිලාගේ වයස ජයන්තගේ වයසින් 5/6කි. ඔවුන් විවාහ වන විට ඔවුන් දෙදෙනාගේ වයස කීයද ?

- **මිනිසුන් හතර දෙනෙක් හා ගැහැණු හතර දෙනෙක් පේළියට වාඩි වී සිටිති. ඔවුන් වාඩි වී සිටින අනුපිළිවෙල පහත සඳහන් වාක්‍යවලින් දැක්වේ. මේ වාක්‍ය අතුරෙන් දෙකක් අනෙක් ඒවාට ප්‍රතිවිරුද්ධ හෙයින් වැරදි වේ.**

(අ) නිහාල්ගේ දකුණු පසින් ගැහැණු තිදෙනෙක් හා එක් පිරිමියෙක් වාඩි වී සිටිති.
(ඉ) ශිලාගේ වම්පසින් සිටියේ පිරිමින් දෙදෙනෙකු පමණි.
(ඊ) ශිලාගේ දකුණු පසින් පිරිමි තිදෙනෙක් හා එක් ගැහැණියක් ද සිටිති.

වැරදි වාක්‍ය දෙක දැක්වෙන අක්ෂර ලියා දක්වන්න.

58. ........................................ 59. ........................................

අමර 

රමණි 

මහර  නම්, අමරහ කුමක්ද ?

''බුද්ධි කලම්බනයක නවමු මග''

**ශ්‍රී ලංකා පරිපාලන සේවා විවෘත/ සීමිත තරග විභාගය**

**සාමාන්‍ය දැනීම**

# එක්සත් ජාතීන්ගේ සංවිධානය UNO

පළමු හා දෙවන ලෝක යුධවලින් පසුව එක්සත් ජනපදය - බ්‍රිතාන්‍ය - සොවියට් දේශය ඇතුලු යුරෝපයට මෙන්ම ලොව පුරා අනෙකුත් රාජ්‍යයන්ට නාසි ජර්මනිය - ඉතාලිය හා ජපානය වැනි රාජ්‍යයන් අභියෝගයක් වූ හෙයින් අන්තර්ජාතික ගැටුම් වලින් තොරව සාමයෙන් ජීවත් වීමේ අවශ්‍යතාවය මතුවිය. 1942 වසරේ රාජ්‍යයෝ 26 ක් එකතු වී ප්‍රථම එක්සත් ජාතීන්ගේ පොදු එකඟතාව කෙටුම්පත් කළහ. පසු යුධ සමයේ එනම් 1945 අප්‍රේල් 25 දින ඇමරිකාවේ සෙන් ප්‍රැන්සිස්කෝ නගරයේදී ප්‍රථම වතාවට ඇමරිකානු ජනාධිපති ප්‍රැන්ක්ලින් රූස්වෙල්ට් - බ්‍රිතාන්‍ය අගමැති වින්ස්ටන්ට් චර්චිල් හා සෝවියට් නායක ජොසප් ස්ටලින් එක්ව ගිවිසුමට අත්සන් තැබූහ. යුරෝපා රාජ්‍යයන් 9 ක්. දකුණු ඇමරිකා රාජ්‍යය 21 ක්, මැද පෙරදිග රාජ්‍යය 7ක්, පොදු රාජ්‍ය මණ්ඩල සාමාජික රාජ්‍යය 5ක්, සෝවියට් සමූහාණ්ඩුවට අයත් සාමාජිකයන් 2ක්, නැගෙනහිර ආසියානු රාජ්‍යය 2 ක්, අප්‍රිකානු රාජ්‍යය 3 ක් ඇතුලු රාජ්‍යයන් 51 ක් නිරීක්ෂණ සාමාජිකයෝ ලෙස සහභාගි වූහ.

ගෝලීය සාමය හා සහයෝගිතාව සඳහා අන්තර් පාර්ලිමේන්තු කණ්ඩායම විසින් 1945 ඔක්තෝම්බර් මස 24 දින එක්සත් ජාතීන්ගේ සංවිධානය ස්ථාපිත කළේය. දෙවන ලෝක යුද්ධයෙන් පසු ඒකරාශි වූ මිත්‍ර ජාතිකයන් නැවත ලෝක ගැටුමක් සිදු නොවීම වගබලා ගැනීම මෙහි මූලික පරමාර්ථයයි. ආරම්භයේ සාමාජිකයෝ 51 දෙනෙකි. වර්තමානයේ නිත්‍ය සාමාජික සංඛ්‍යාව 193 කි. ප්‍රධාන කාර්යාලය ඇමරිකාවේ මැන්හැටන් ප්‍රදේශයේ නිව්යෝර්ක් නගරයේ පිහිටා ඇත. එමෙන්ම ජිනීවා, නයිරෝබි හා වියානාවල ශාඛා කාර්යාල ක්‍රියාත්මක වෙයි. සංවිධානය නඩත්තු වන්නේ සාමාජික රාජ්‍යයන් ලබා දෙන අරමුදල් මගින්ය.

ප්‍රධාන අරමුණු හා ක්‍රියාකාරිත්වය

අන්තර්ජාතික සාමය, ගෝලීය ආරක්ෂාව, මානව හිමිකම්, සමාජ ආර්ථික සංවර්ධනය, පරිසරය සුරැකීම, ස්වභාවික ව්‍යසන හා ගැටුම් අවස්ථාවල මානුෂික ආධාර සැපයීම

<u>එක්සත් ජාතීන්ගේ දිනය සෑම වසරකම ඔක්තෝම්බර් 24</u>

**එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රධාන ආයතන**

- මහා සභාව General Assembly
- ආරක්ෂක මණ්ඩලය Security Council
- ආර්ථික සමාජ මණ්ඩලය Economic and Social Council
- ලේකම් කාර්යාලය the Secretariat
- අන්තර්ජාතික අධිකරණය International Court of Justice
- භාරකාර මණ්ඩලය United Nation Trusteeship Council
- ලෝක බැංකු කණ්ඩායම World Bank Group
- ලෝක සෞඛ්‍ය සංවිධානය World Health Organization
- ලෝක ආහාර වැඩසටහන World Food Programme
- එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන - විද්‍යා - සංස්කෘතික සංවිධානය UNESCO
- එක්සත් ජාතීන්ගේ අන්තර්ජාතික ළමුන් සඳහා වූ හදිසි අරමුදල UNICEF

**2001 වසරේ මානව සංවර්ධනය හා ලෝක සාමය සඳහා නොබෙල් සම්මානය පිරිනැමීම**

- 2011 වසරේ දකුණු සුඩානය පූර්ණ සාමාජිකත්වය ලැබීම.
- 2012 වසරේ පලස්තීනය නිරීක්ෂක රාජ්‍යයක් ලෙස සුදුසුකම් ලැබීම.
- සර්බියාව, කොසෝවෝ හා උතුරු කොරියාව රාජ්‍යයන් සියයක් විසින් ස්වාධීන රාජ්‍යයන් ලෙස පිළිගෙන ඇත.

- සාමාජික රාජ්‍යයෝ 193
- නිරීක්ෂණ රාජ්‍යයෝ 2
- අර්ධ වශයෙන් පිළිගත් රාජ්‍යයෝ 6
- පිළි නොගත් රාජ්‍යයෝ 3 - 6
- එකතුව 207

2016 වසරේ ඔක්තෝම්බර් මස 13 දින රැස්වූ එක්සත් ජාතීන්ගේ මහා සභාව නව ලේකම්වරයා ලෙස පෘතුගාලයේ හිටපු අග්‍රාමාත්‍ය අන්තෝනියෝ ගුටෙරස් Antonio Guterres තෝරා පත්කර ගත්හ. ඒ අනුව 2016 දෙසැම්බර් 31 ලේකම් බන් කී මූන්ගේ Ban Ki-moon සේවා කාලය අවසන් විය.

එක්සත් ජාතීන්ගේ මහා සභාවේ අනුමැතිය අනුව සෑම වසරක් සඳහාම සභාපති වරයෙක් තෝරා පත්කර ගනිති. 2016 සැප්තැම්බර් මස 71 වැනි සභාපතිවරයා ලෙස ෆිජී රාජ්‍යයේ එක්සත් ජාතීන්ගේ තානාපති පීටර් තොම්සන් පත්කර ගත්හ.

- 2014 - 2015 සෑම් කුටෙසා උගන්ඩාව
- 2015 - 2016 මෝගන්ස් ලික්කෙටෝෆ්ට් ඩෙන්මාර්ක්

## එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම UNHRC

එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුබද්ධ මානව හිමිකම් කොමිසම අන්තර් පාර්ලිමේන්තු කණ්ඩායමට අයත් සාමාජිකයින් 47 දෙනෙකුගෙන් සෑදී ඇත. මෙම සාමාජික කණ්ඩායම ලොව පුරා මානව හිමිකම් ප්‍රවර්ධනය හා ආරක්ෂාව වෙනුවෙන් පෙනී සිටියි. මානව හිමිකම් කොමිසම 1946 වසරේ ආරම්භ විය. ප්‍රථමයෙන් මානව හිමිකම් කොමිසම රැස්වූයේ 1947 වසරේ ජනවාරි මාසයේය. විශ්ව මානව හිමිකම් ප්‍රකාශනය 1948 දෙසැම්බර් 10 එළිදැක් විය.

<u>මානව හිමිකම් දිනය දෙසැම්බර් 10</u>

1967 වසරේ මානව හිමිකම් කොමිසම සාමාජික රජ්‍යයන් විසින් තම රාජ්‍යයන් තුළ වෙසෙන පුරවැසියන්ගේ මානව අයිතීන් උල්ලංඝනය කළ විට පුරවැසියන්ගේ මානව අයිතීන් වෙනුවෙන් මැදිහත්වීම මානව හිමිකම් කොමිසමේ පිළිගත් ප්‍රතිපත්තියකි. අප්‍රිකානු රාජ්‍යයන් තුළ ක්‍රියාත්මක වූ යටත්විජිත වර්ණභේදවාදය අවසන් කිරීමට හා මානව අයිතීන් හඳුන්වා දීමට මෙන්ම මානව වර්ගයාට එරෙහි ප්‍රචණ්ඩත්වය පරීක්ෂා කිරීම, සිවිල් යුද තත්ත්වයන්, වාර්ගික හා ආගමික ගැටුම් හා වැරදිකරුවන් අධිකරණයට පැමිණවීම එම මැදිහත්වීමට අයත්ය. 1970 වන විට ලොව පුරා මානව හිමිකම් වෙනුවෙන් පෙනී සිටින කණ්ඩායම් වලට උපකාර කිරීම හා අවශ්‍ය සහාය ලබා දීම ප්‍රතිපත්තියක් වශයෙන් පිළිගත්තේය.

අන්තර් ජාතිකව මානව හිමිකම් රැකගැනීමේ අවශ්‍යතාව තහවුරු කිරීම සඳහා මානව හිමිකම් කොමිසම අංශ හතකට බෙදා වෙන් කර ඇත.

- සුළු වාර්ගිකයන්
- පාර ජාතික සමාගම්
- අධිකරණ පරිපාලනය
- ත්‍රස්තවාදය වැළැකීම
- ආදිවාසි ජනයා
- සන්නිවේදනය
- සමාජ මණ්ඩපය

2006 මාර්තු මස 27 දින මානව හිමිකම් කොමිසම එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම වඩාත් ඵලදායි ආයතනයක් ලෙස ප්‍රතිව්‍යුහ ගත කළේය.

ෂෙයිඩ් රාඩ් අල් හුසෙන් 2014 සැප්තැම්බර් 01 දින මානව හිමිකම් මහා කොමසාරිස්වරයා ලෙස පත් විය. හෙතෙම ජෝදාන් ජාතිකයෙකි.

# එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන - විද්‍යා හා සංස්කෘතික සංවිධානය UNESCO

1942 නොවැම්බර් මස 16 දින ලොවපුරා රාජ්‍යයන් 18 ක අධ්‍යාපන ඇමතිවරු රැස්ව ප්‍රථම අධ්‍යාපන සම්මන්ත්‍රණය ඇරඹූහ. එම සාකච්ඡාව 1945 දක්වා අඛණ්ඩව පැවතිණ. 1945 අප්‍රේල් මාසය හා ජුනි දක්වා ඇමරිකාවේ සෙන් ප්‍රැන්සිස්කෝ නගරයේ පැවති සාකච්ඡා වටයේදී රාජ්‍යයන් 44 ක නියෝජිත එකමුතුවෙන් අධ්‍යාපන - විද්‍යා හා සංස්කෘතික සංවිධානය ස්ථාපිත කිරීම යෝජනා විය. එම සම්මුතියට අනුව 1946 නොවැම්බර් 04 දින යුනෙස්කෝ සංවිධානය ආරම්භ කළහ.

1925 සිට 1946 දක්වා කාලය තුළ බුද්ධිමය සහයෝගිතාව සඳහා වූ අන්තර්ජාතික සංගමය ආරම්භ වී තිබුන අතර, එම සංවිධානය 1968 දක්වා වෙනම ක්‍රියා කොට 1969 වසරේදී යුනෙස්කෝව සමග එකතු විය.

වර්තමානයේ යුනෙස්කෝ සංවිධානය සංස්කෘතිය අධ්‍යාපනය ස්වභාවික විද්‍යාව සමාජ හා මානව විද්‍යාව තොරතුරු හා සන්නිවේදනය (Culture, Education, Natural Science, Social and Human Science, and Communication and Information), යන ක්ෂේත්‍රවල නව දැනුම හා තාක්ෂණය සාමාජික රාජ්‍යයන් අතර බෙදා ගැනීම - ප්‍රවර්ධනය මෙන්ම සාමාජික රාජ්‍යයන්ගේ මානව හා ආයතනික ධාරිතාව සංවර්ධනය කිරීමේ ක්‍රියාකාරකම් වල නිරතව සිටියි.

වර්තමාන සාමාජික සංඛ්‍යාව රාජ්‍යයන් 195 කි. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නිත්‍ය සාමාජික රාජ්‍යයන් 193 හා පලස්තීනය හා කුක් දූපත් එහි සාමාජිකත්වය ලබා ඇත. යුනෙස්කෝ සංවිධානය අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු යටතේ ක්‍රියාත්මක වෙයි.

අරමුණු

- අධ්‍යාපනය - සමාජ සාධාරණය - ගෝලීය සාමය හා ජාතීන් අතර සහයෝගිතාව

ක්‍රියාකාරකම්

- සැමට මූලික අධ්‍යාපනය සාක්ෂරතාව, HIV/AIDS රෝග අසාදනය වළකා ගැනීම සඳහා සඟරා කලාපයේ ගුරු පුහුණුව, උසස් තත්ත්වයේ අධ්‍යාපන ප්‍රවර්ධනය, ඉතා හොඳ ද්වීතිය අධ්‍යාපනය, තාක්ෂණික අධ්‍යාපනය හා උසස් අධ්‍යාපනය.

- පාතුවි සම්පත් ස්වභාවික විද්‍යාව අනුව කළමනාකරණය, පානීය ජලය හා ජලයේ ප්‍රමිතිය රැක ගැනීම, සාගර රැකගැනීම, තිරසර සංවර්ධනය සඳහා විද්‍යාව හා ඉංජිනේරු ශිල්පය යොදා ගැනීම, ආපදා කළමණාකරණය හා පෙර සූදානම

- මූලික මානව අයිතීන් ප්‍රවර්ධනය වර්ගවාදයට හා නොසලකා හැරීමට එරෙහි වීම
- සංස්කෘතික විවිධත්වය අගයකිරීම හා උරුමයන් රැකගැනීම.
- දැනුම තොරතුරු හා සන්නිවේදනය මානව සංවර්ධනය සඳහා බෙදාගැනීම.
- දේශගුණික වෙනස - ස්ත්‍රී පුරුෂ සමානත්මතාව බහුවිධ භාෂා සංරක්ෂණය

## එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල

දෙවන ලෝක යුද්ධයෙන් පසුව යුරෝපයේ ළමා පරපුර සාගින්නෙන් හා රෝගාබාධයන්ගෙන් පීඩාවට පත්වූහ. එක්සත් ජාතින්ගේ හදිසි ළමා අරමුදල 1946 දී නිර්මාණය වූයේ ඔවුන් රැක ගැනීම සඳහාය. 1953 වසරේදී ළමා අරමුදල එක්සත් ජාතින්ගේ සංවිධානයේ ස්ථිර ආයතනයක් ලෙස නම් කෙරිණ.

- 1965 වසරේ ජාතීන් අතර සහෝදරත්වය ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් නොබෙල් සාම ත්‍යාගය හිමි විය.
- 1979 වසරේ ළමා අයිතීන් රැකගැනීම නීතියක් ලෙස ගෙන එමින් ලොව පුරා ජනයාගේ ප්‍රශංසාවට ලක් විය.
- ළදරු වර්ධනයට හේතු වන මව්කිරි උපතේ සිට දරුවා වැඩෙන තෙක් ලබාදීම සඳහා මව්වරුන් පෙළඹවීම 1981 සිට ජනගත කිරීම.

- සෑම වසරකම ළමා අරමුදල මිලියන ගණනක දරුවන් විවිධ පීඩා වලින් මුදවා ගනියි.
- ආර්ථික කටයුතු නිසා ලොව පුරා දුප්පත් රාජ්‍ය වල දරුවන් හා ස්ත්‍රීන් මුහුණපාන පීඩාවන් අධ්‍යනය කොට අවශ්‍ය සැලසුම් නිර්මාණය කිරීම.
- 1989 සිට ළමා අයිතීන් මූලික මානව හිමිකමක් ලෙස පිළිගැනීමට සාමාජික රාජ්‍යයන් යොමුකිරීම.
- 1990ලෝක ළමා සමුළුව පවත් අධ්‍යාපනය සෞඛ්‍යය හා පෝෂණය වසර දහයක ඉලක්කයක් හඳුන්වා දීම.
- සිවිල් යුද හා අභ්‍යන්තර ගැටුම් පවතින කලාප තුළ දරුවන් පීඩාවට පත්වීම ආරක්ෂක මණ්ඩලය තුළ සාකච්ඡා කිරීම.
- ළමා අරමුදල සඳහා රාජ්‍යයන් 190 ක් සාමාජිකත්වය ලබාගෙන ඇත.

## ලෝක සෞඛ්‍යය සංවිධානය World Health Organization WHO

ගෝලීය පොදු සෞඛ්‍ය සංවර්ධනය සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 1948 අප්‍රේල් මස 07 වන දින ස්විස්ටර්ලන්තයේ ජිනීවා නුවර ලෝක සෞඛ්‍යය සංවිධානය ස්ථාපිත කළේය. ප්‍රථම වරට 1946 ජූලි මස 22 දින සාමාජිකයන් 61 ක් අත්සන් කොට ආරම්භ කළේ ය. ලෝක සෞඛ්‍යය සංවිධානය ආරම්භ කළ මොහොතේ සිට වසූරිය වසංගතය අවසන් කිරීමට මූලිකත්වය දුන්නේය. තවද ඒඩ්ස් වෛරසය, එබෝලා, ෂිකා, මැලේරියාව හා ක්ෂය රෝගය තුරන් කිරීමට උනන්දු විය.

බෝවෙන හා බෝ නොවන රෝග, ප්‍රජනන සෞඛ්‍යය හා සෞඛ්‍ය ගැටළු වාර්තාකරණය, සෞඛ්‍ය අධ්‍යාපනය ප්‍රවර්ධනය, ප්‍රකාශන, තොරතුරු ජාලගත කිරීම, වාර්ෂික ව ගෝලීය සෞඛ්‍ය වාර්තාව ඉදිරිපත් කිරීම, ගෝලිය සෞඛ්‍ය පර්යේෂණ වැනි ක්‍රියාකාරකම් හා වැඩසටහන් සඳහා මුල්‍යාධාර සැපයීම ප්‍රධාන අරමුණු ලෙස සටහන් කළ හැක.

<u>ලෝක සෞඛ්‍ය දිනය අප්‍රේල් 07</u>

- 1950 ක්ෂය රෝග මර්ධන වැඩසටහන
- 1955 මැලේරියා මර්දන වැඩසටහන
- 1965 දියවැඩියාව පළමු වාර්තාව
- 1974 ප්‍රතිශක්තිකරණ වැඩසටහන
- 1977 අත්‍යවශ්‍යය ඖෂධ ලේඛනය සැකසීම.
- 1996 එක්සත් ජාතීන්ගේ ඒඩ්ස් මර්දන වැඩසටහන

ආහාර හා කෘෂිකර්ම සංවිධානය, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන, ලෝක බැංකුව හා එක්ව ලෝක සෞඛ්‍ය ප්‍රවර්ධනය වෙනුවෙන් කටයුතු කරයි.

## ලෝක කම්කරු සංවිධානය ILO

එක්සත් ජාතීන්ගේ සංවිධානයට අයත් සාමාජික රාජ්‍යයන්, කර්මාන්ත හිමියන් හා කම්කරුවන් එකමුතු කර ඔවුන්ගේ ගැටළු විසඳාගැනීම සඳහා පහසුකම් සැලසීම ලෝක කම්කරු සංවිධානයේ පරමාර්ථයයි. සංවිධානයට අයත් සාමාජික රාජ්‍යය සංඛ්‍යාව 183 කි. පොදු ක්‍රියාකාරකම් හා යහපත් සේවා ප්‍රවර්ධනය සඳහා උපායමාර්ග හඳුන්වා දී ඇත. 1919 වසරේ මුල්වරට ලෝක කම්කරු ජනයාගේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා ලෝක කම්කරු සංවිධානය ආරම්භ විය. 1946 දී එක්සත් ජාතීන්ට අනුබද්ධ ආයතනයක් ලෙස නම් කළේ ය.

**ලෝක කම්කරු සංවිධානයේ අරමුණු හා ක්‍රියාකාරකම්**

- අන්තර්ජාතික කම්කරු ප්‍රමිතිය හා අයිතිය පිළිබඳ මූලධර්ම
- තිරසර ව්‍යවසායකත්වය හා ආදායම් උත්පාදන අවස්ථා
- සමාජ අරක්ෂණය
- සමාජ සංවාද හා ත්‍රි පාක්ෂික උපදේශකත්වය
- ස්ත්‍රී පුරුෂ සමානත්වය හා නොසලකා හැරීම අවම කිරීම
- සේවකයන් සඳහා වෘත්තීය හා සේවස්ථ පුහුණු වෙනුවෙන් ජංගම වැඩසටහන් පැවැත්වීම
- වෘත්තීය පුහුණු විශේෂයෙන්ම ස්ත්‍රීන්ට තම සේවා කටයුතු සඳහා විශේෂ අවස්ථා ලබාදීම.

- වැටුප් හා සේවා ස්ථානයේ ගැටළු විසඳා ගැනීමට මැදිහත් වීම.
- සේවක අයිතීන් වෙනුවෙන් මැදිහත් වීම.

ලෝක කම්කරු සංවිධානය වානිජ ආර්ථික, මානව හිමිකම් හා සංවර්ධන ආයතන සමඟ සුහදව කටයුතු කරයි. එමෙන්ම යුරෝපා සංගමය G8 හා G20 කණ්ඩායම්වල රැස්වීම් වලට සහභාගි වෙයි.

1969 ලෝක කම්කරු සංවිධානය වෙත එහි සේවාව වෙනුවෙන් නොබෙල් සාම සම්මානය පිරිනැමී ය.

## ලෝක බැංකුව WB

ලෝක බැංකුව ස්ථාපිත වූයේ 1944 වසරේ ය. ආරම්භයේදී නැවත ගොඩනැගීම හා සංවර්ධනය සඳහා වූ අන්තර්ජාතික බැංකුව නමින් නම් කළේ ය. පසුව එය ලෝක බැංකුව යනුවෙන් හැඳින්විය. ප්‍රථමයෙන් සාමාජිකයින් 38 දෙනෙකුගෙන් ආරම්භ වුවද අද එහි සාමාජිකත්වය 184 දක්වා වර්ධනය වී ඇත. ලෝක බැංකුව නියෝජිත ආයතන පහකින් පෙළ ගැසී ඇත. රාජ්‍යයන් 100 ක ශාඛා කාර්යාල පිහිටා ඇත.

### ලෝක බැංකුවේ පරමාර්ථ හා ක්‍රියාකාරිත්වය

- සාමාජික රාජ්‍යයන්ට පාසල් අධ්‍යාපන, සෞඛ්‍ය පහසුකම්, පානීය ජලය, විදුලිය, පරිසර සංරක්ෂණය සඳහා මුල්‍යාධාර හා තාක්ෂණික උපදෙස් ලබාදීම.
- ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ණය පහසුකම් තාක්ෂණික සහාය හා මුල්‍යාධාර
- දුප්පත් රාජ්‍යයන් තුළ ජනයාගේ ජීවන තත්වය ඉහළ දැමීම සඳහා වැඩසටහන්
- දුප්පත්කම අවකරණය කිරීම.

## අන්තර්ජාතික මූල්‍ය අරමුදල IMF

අන්තර්ජාතික මූල්‍ය අරමුදල බ්‍රෙටන්වුඩ් සාකච්ඡා මාලාවට අනුව 1944 දී ලෝක බැංකුව හා සමගාමීව කළඑලියට පැමිණියේ ය. ලෝක බැංකුව උපකාර සපයන්නේ සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයන් වෙතයි. එහෙත් අන්තර්ජාතික මූල්‍ය අරමුදල එහි පරමාර්ථ ලෙස අන්තර්ජාතික මූල්‍ය ප්‍රතිපත්ති සැලසුම් කිරීම වෙනුවෙන් පෙනී සිටියි. ඇමරිකාවේ වොෂින්ටන් නුවර ප්‍රධාන කාර්යාල පිහිටා ඇති අතර සාමාජික සංඛ්‍යාව 188 කි.

- අන්තර්ජාතික මූල්‍ය අරමුදලේ ප්‍රතිපත්ති හා ක්‍රියාකාරිත්වය
- ගෝලීය මුල්‍ය සහයෝගිතාව මුල්‍ය ස්ථාවරත්වයට ආරක්ෂාව සැලසීම
- අන්තර්ජාතික වෙළඳාමට පහසුකම් සැලසීම
- තිරසර ආර්ථික සංවර්ධනය
- දුප්පත්කම අවකරණය කිරීම ප්‍රතිපත්ති සැලසුම් කිරීම ආර්ථික කටයුතු සඳහා උපදෙස් සැපයීම.

## ලෝක වෙළඳ සංවිධානය WTO

ලෝක වෙළඳ සංවිධානය අන්තර්ජාතික වෙළඳ කටයුතු නියාමනය කිරීම සඳහා අන්තර් පාර්ලිමේන්තු කණ්ඩායමකින් නිර්මාණය වී ඇත. ප්‍රධාන කාර්යාලය ස්විස්ටර්ලන්තයේ ජිනීවා නුවර 1995 ජනවාරි 01 දින ස්ථාපිත කළේ ය. ලෝක වෙළඳ සංවිධානය 1986 - 1994 කාලය තුළ පැවති උරුගුවේහි දීර්ඝ සාකච්ඡා වටයකින් පසු රාජ්‍යයන් 123 සහභාගිත්වයෙන් 1948 සිට පැවති වෙළඳ හා රේගුබදු සඳහා වූ පොදු ගිවිසුම වෙනුවට හඳුන්වා දුන් අන්තර්ජාතික සංවිධානයකි.

- සාමාජික රාජ්‍යයන් අතර සිදුවන වෙළඳ ගිවිසුම් නියාමනය හා ප්‍රමිතීන් හඳුන්වාදීම සඳහා මැදිහත් වීම.
- නිදහස් වෙළඳපල කාර්මික භාණ්ඩ හා සේවා කෘෂිකාර්මික භාණ්ඩ සඳහා සාධාරණ වෙළඳපලක් නිර්මාණය කිරීම.
- අන්තර්ජාතික වෙළඳපල මත පදනම් වූ බහු පාර්ශික හා ද්වි පාර්ශික වෙළඳ ගිවිසුම් ප්‍රවර්ධනය කිරීම.
- වෙළඳ සංවිධානයේ මැදිහත් වීම මත ලොව පුරා භාණ්ඩ වෙළඳපල ගිවිසුම 60 ක් පමණ ක්‍රියාත්මක වෙයි.

## අන්තර්ජාතික ප්‍රමිති ආයතනය ISO

නිත්‍ය සාමාජිකයින් 162 ක් සහිත ස්වාධීන ජාත්‍යන්තර සංවිධානයක් ලෙස අන්තර්ජාතික ප්‍රමිති ආයතනය හැඳින්විය හැක. පොදු එකඟතා මත දැනුම බෙදා ගනිමින් වෙළඳපොල පදනම් කරගත් අන්තර්ජාතික ප්‍රමිතීන් හඳුන්වාදීම නව සොයාගැනීම් සඳහා උපකාර කිරීම හා ගෝලීය අභියෝග සඳහා විසඳුම් සෙවීම ආයතනයේ පරමාර්ථ හා ක්‍රියාකාරකම් ලෙස දැක්වෙයි. ස්විස්ටර්ලන්තයේ ජිනීවා නුවර ප්‍රධාන කාර්යාලය පිහිටා ඇත. නිෂ්පාදන සේවා හා ක්‍රියා පද්ධති සඳහා ගෝලීය මට්ටමේ ප්‍රමිතියක් ලබා දෙයි. තත්ව සහතික, ආරක්ෂාව හා කාර්යසාධනය අන්තර්ජාතික වෙළඳාමේදී ඉතා යහපත් බව මෙවලම් ලෙස භාවිත වෙයි. අන්තර්ජාතික ප්‍රමිති ආයතනය වාර්ථා 19,000 ක් පමණ ප්‍රකාශයට පත් කර ඇත. සෑම කර්මාන්තයක්ම තාක්ෂණය, ආහාර සුරක්ෂිතභාවය, කෘෂිසංස්කෘතිය හා සෞඛ්‍ය රක්ෂණය මෙහිදී ප්‍රමුඛස්ථානය ගනියි.

1947 පෙබරවාරි 23 දින ආරම්භ විය. 2015 අවසන් වන විට ලොව පුරා රාජ්‍යයන් 196 ක් සමඟ ක්‍රියාත්මක විය. එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ සංගමය සමඟ අනුබද්ධව කටයුතු කරයි. රාජ්‍ය සංඛේත නාමාවලිය "country code" ISO 3166-1 හඳුන්වයි. ලොව පුරා බොහෝ සමාගම් හා සංවිධාන මෙම සංඛේත නාමාවලියට ඇතුලත්ය. සෑම රටක්ම ඉංග්‍රීසි අකුරු දෙකකින් හඳුන්වයි. ලොව පුරා සෑම රටකම වෙබ් පිටු මෙම සංඛේතයෙන් දැක්වෙයි.

අන්තර්ජාතික ප්‍රමිති සංවිධානය තම සාමාජිකත්වය සඳහා එක්සත් ජාතීන්ට අයත් නාම ලේඛනය අනුගමනය කළ ද, සංකේත පද්ධතියට අනුව ස්ව සාමාජිකත්වය රාජ්‍යයන් 249 දක්වා වර්ධනය කර ඇත. එක්සත් ජාතීන්ගේ සංවිධානය තවමත් ඇතැම් රාජ්‍යයන් පිළිගෙන නොතිබුණ ද, මවු රාජ්‍යයෙන් වෙන්ව ස්වයං පාලන අයිතිය ලබා ඇති භූ කලාප අන්තර්ජාතික ප්‍රමිති සංවිධානය විසින් පිළිගෙන ඇත.

- එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකයෝ 193
- එක්සත් ජාතීන්ගේ නිරීක්ෂණ සාමාජිකයෝ 02
- අර්ධ වශයෙන් හඳුනාගත් රාජ්‍යයන් 02
- ගෝත්‍රික ජනාවාස සහිත භූ කලාප 45
- ජනාවාස නොවන භූ කලාප 06
- අන්ටාටිකාව 01
- සියලු රාජ්‍යයෝ 249

ඔලිම්පික් සාමාජිකයෝ

- 2016 ඔලිම්පික් තරඟාවලිය සඳහා සුදුසුකම් ලැබූ සමාජික රාජ්‍ය සංඛ්‍යාව 206 දෙනෙකි.

## සොබාදහම සංරක්ෂණය සඳහා වූ අන්තර්ජාතික එකමුතුව IUCN

සොබාදහම සංරක්ෂණය සඳහා වූ අන්තර්ජාතික එකමුතුව පරිසරය හා සංවර්ධන අභියෝග සඳහා උපායමාර්ගිකව විසඳුම් සෙවීම සඳහා මැදිහත් වෙයි. සොබා සංරක්ෂණය, සොබාදහම පදනම් කර ගත් විසඳුම් දේශගුණික වෙනස, ආහාර සුරක්ෂිතභාවය හා තිරසර සංවර්ධනය සඳහා විද්‍යාත්මක පර්යේෂණ, ක්ෂේත්‍ර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම. ප්‍රතිපත්ති හා නීති සම්පාදනය ප්‍රධාන ක්‍රියාකාරකම් වෙයි. 1948 දී ආරම්භ කළ ලොව පැරණි සොබා සංරක්ෂණය සඳහා වූ ආයතනය වන අතර රාජ්‍යයන් 200 ක් හා රාජ්‍ය නොවන ආයතන 900 සමඟ සුහදව කටයුතු කරයි.

ස්විස්ටර්ලන්තයේ ජිනීවා නුවර යාබද ග්ලෑන්ඩ් හි ප්‍රධාන කාර්යාලය පිහිටා ඇත. වාර්ෂිකව අනතුරට හා වඳව යාමට ආසන්න සත්ව හා ශාඛ විශේෂ හඳුනා ගෙන ඒවා රතු දත්ත පොතට IUCN Red List of Threatened Species එකතු කරයි රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන 1100 ක් එහි සාමාජිකයෝ ය.

<u>වඳව යාමේ තර්ජනයට ලොව පුරා ජීව විශේෂ 79,800 ඇතුළත්ව ඇත.</u>

## යුරෝපා කොමිසම The European Commission (EC)

යුරෝපා කොමිසමේ සාමාජිකයන් 28 දෙනා ලක්සේම්බර්ග් හි පිහිටි යුරෝපා අධිකරණය ඉදිරියේ එහි ගෞරවය ස්වාධීනත්වය ආරක්ෂා වෙන පරිදි කටයුතු කරන බවට දිවුරුම් දිය යුතුය. නීති සම්පාදනය, ප්‍රතිපත්ති හා තීරණ

ක්‍රියාවේ යෙදවීම ඔවුන්ගේ කාර්යයභාරයයි. සෑම සාමාජික රාජ්‍යයක් වෙනුවෙන්ම එක් සාමාජිකයෙක් නියෝජනය වෙයි. ඔවුන් අතර එක් අයෙකු යුරෝපා සංගමයේ ප්‍රධානියා ලෙස තෝරා පත්කර ගනියි. පරිපාලන සඳහා තවත් සිවිල් නිලධරයන් 23,000 ක් පත් කරනු ලැබේ. ඉංග්‍රීසි, ප්‍රංශ හා ජර්මන් නිල භාෂා ලෙස භාවිත වෙයි.

යුරෝපා සංගමයේ සාමාජිකයෝ 28 දෙනෙකි.

- ඕස්ට්‍රියාව, බෙල්ජියම, බල්ගේරියා, චෙක් සමූහාණ්ඩුව, ඩෙන්මාර්ක්, ජර්මනිය, එස්ටෝනියා, ග්‍රීසිය, ස්පාඤ්ඤය, ප්‍රංශය, ක්‍රොඒසියාව, අයර්ලන්තය, ඉතාලිය, සයිප්‍රස්, ලැට්වියා, ලිතුවේනියා, ලක්ෂේම්බර්ග්, හන්ගේරියා, මෝල්ටා, නෙදර්ලන්තය, පෝලන්තය, පෘතුගාලය, රොමේනියා, ස්ලෝවේනියා, ස්ලෝවැකියා, ෆින්ලන්තය, ස්වීඩනය, එක්සත් රාජධානිය

යුරෝපය ඒකාබද්ධ වීමේ ගමන්මග

1951 - 1952 පැරිස් ගිවිසුම හා 1957 - 1958 රෝම ගිවිසුම (යුරෝපා පරමාණු බලශක්ති කොමියුනය)

1965 - 1967 ඒකාබද්ධ වීමේ ගිවිසුම (යුරෝපා ප්‍රජාව සඳහා කොමිසම)

2007 - 2009 යුරෝපා කොමිසම

2009 ඔක්තෝම්බර් 31 ප්‍රථම කොමිසම සාමාජික රාජ්‍යයන් 27 ක එකඟතාව මත පිහිටුවිය. සාමාජික රාජ්‍යයන් නියෝජනය කරන නියෝජිතයන්ගෙන් මහා සභාව සැකසෙයි. යුරෝපා පාර්ලිමේන්තුව සාමාජික රාජ්‍යන්ගේ සියලු පුරවැසියන් අයත් වෙයි. සංවිධානය වූ සිවිල් සාමාජය ආර්ථික හා සමාජ කොමිටිය නියෝජනය කරයි. කලාපිය කොමිටිය ස්ථානීය හා කලාපීය බලඅධිකාරීන් නියෝජනය වෙයි.

## නාසා ජාතික ගුවන් හා අභ්‍යවකාශ පරිපාලන මධ්‍යස්ථානය NASA

එක්සත් ජනපදයේ ජාතික ගුවන් හා අභ්‍යවකාශ පරිපාලන මධ්‍යස්ථානය National Aeronautics and Space Administration NASA යනුවෙන් හැඳින්වෙන අතර එය එරට රජයට අයත් ආයතනයකි. එහි කාර්‍යභාරය ගුවන්, අභ්‍යවකාශ විද්‍යාව තාක්ෂණය පර්යේෂණයේ සමස්ථ වගකීමයි. 1957 වර්ෂයේ සෝවියට් දේශය ප්‍රථමවරට ස්පුට්නික් Sputnik චන්ද්‍රිකාව අභ්‍යවකාශ ගත කළ අතර 1958 එක්සත් ජනපදය විසින් නාසා ආයතනය වොෂින්ටන්හි පිහිටුවිය.

චන්ද්‍රිකා තාක්ෂණය විද්‍යාඥයන්ට පෘථිවිය හා අභ්‍යවකාශය, සූර්ය ග්‍රහ මණ්ඩලය පිළිබඳ හැදෑරීමට හා පර්යේෂණයන්ට බෙහෙවින් උපකාර වෙයි. එමෙන්ම ලෝකය පුරා ගුවන් ගමන් පහසුකරණය සඳහා තොරතුරු හා තාක්ෂණික සහාය ලබාදීම සිදු වෙයි. අනෙකුත් තාරකා හා ග්‍රහයන් වෙත මිනිසුන් රහිත පර්යේෂණ යානා සඳහා පිටත් කරයි.

නාසා අධ්‍යාපන අංශය ගුරුවරුන්ට හා සිසුන්ට අභ්‍යවකාශ විද්‍යාව හැදෑරීමට පහසුවක් සලසයි. එමෙන්ම ඉංජිනේරුවන්, විද්‍යාඥයන්, තාරකා විද්‍යාඥයන් බිහි කිරීමට අවශ්‍ය අධ්‍යාපන අවස්ථා උදා කරයි. නාසා ආයතනයේ ප්‍රධාන ආයතනය වොෂින්ටන් හි පිහිටා ඇති අතර එක්සත් ජනපදය පුරා ශාඛා මධ්‍යස්ථාන දහයක් පිහිටා ඇත. කාර්යය මණ්ඩලය 18,000 කි.

නාසා ආයතනය මර්කරි, ජෙමිනි, ඇපලෝ අභ්‍යවකාශ යානා වැඩසටහන් ක්‍රියාත්මක කළ අතර 1969 දි මිනිසෙක් සඳ මත පා තැබීමට අවශ්‍ය තාක්ෂණය දියුණු කළේය.

වර්තමානයේ අන්තර්ජාතික අභ්‍යවකාශ මධ්‍යස්ථාන පාථිවියට ඉහළින් කක්ෂයක රඳවා නිරතුරුව විද්‍යාඥයන් එයට සම්බන්ධ කොට පර්යේෂණ මෙහෙයවයි. නාසා ආයතනය සූර්යය ග්‍රහ මණ්ඩලයයේ සෑම ග්‍රහයෙක් වෙතට තම පර්යේෂණ රොබෝ යානාවක් යවා ඇත.

අභ්‍යවකාශයේ රඳවා ඇති හබෙල්, කෙප්ලර් හා K2 දුරේක්ෂයන් මගින් අභ්‍යවකාශයේ අනෙකුත් තාරකා තැන තොරතුරු නිරතුරුව සොයා බලා පෘථිවියට වාර්තා කරයි. එමෙන්ම කාලගුණ තොරතුරු අධ්‍යනයට පෘථිවියට ඉහළින් චන්ද්‍රිකා කක්ෂ ගත කොට ඇත.

සුනිල් රණසිංහ
මානව විද්‍යාඥ

‘‘බුද්ධි කලම්බනයක නවමු මග’’

# ශ්‍රී ලංකා පරිපාලන සේවා විවෘත/ සීමිත තරග විභාගය

## සාමාන්‍ය දැනීම - අමතර කියවීම

**ලොව ප්‍රබල සාහිත්‍ය නර්මාණ**

සාහිත්‍ය නිර්මාණ යනු, මිනිසා සිය අභයන්තර හා බාහිර සිතැඟි මෙන්ම සිය අත්දැකීම් නිර්මාණාත්මක ලෙස ප්‍රකාශ කරන්නා වූ මාධ්‍යයකි.

ලොව ප්‍රථම සාහිත්‍ය නිර්මාණය : ජපන් ජාතික මුරසකි ෂිකිබු විසින් රචිත ගෙන්ජි මොනොගතරි නම් ගද්‍ය ග්‍රන්ථය

සාහිත්‍ය නිර්මාණ රස විඳීමට ජාති, ආගම් හෝ සංස්කෘතිකමය රාමුවකට සීමා වීම අවශ්‍ය නොවුවද ලොව විවිධ රටවල පහල වූ නිර්මාණ සාහිත්‍යමය වශයෙන් වර්ගීකරණයට ලක්කර ඇත. ඒ අතරින් පාඨකයන්ගේ අවධානය වැඩි වශයෙන් යොමු වූ සාහිත්‍යය වශයෙන්

1. ඉන්දියානු සාහිත්‍යය
2. රුසියානු සාහිත්‍යය
3. ජපන් සාහිත්‍යය
4. ඉංග්‍රීසි සාහිත්‍යය නම් කළ හැකිය.

<u>රුසියානු සාහිත්‍යය නිර්මාණ</u>

1. ඇනා කැරනිනා - 19 වන සියවසේ රුසියානු සමාජ පරිවර්තනය නිරූපණය කරනු ලබයි.
   කතෘ - ලියෝ තෝල්ස්තෝයි

2. War and Peace - ‘යුද්ධය හා සාමය’ වශයෙන් සිංහල භාෂවට පරිවර්තනය කර ඇති අතර යුද්ධයේ ස්වභාවය අරමුණු කරගෙන ලියා ඇති නවකතාවකි.
   කතෘ - ලියෝ තෝල්ස්තෝයි

3. Mother - ‘අම්මා’ යනුවෙන් සිංහල භාෂාවට පරිවර්තනය වී ඇත. 1905 දී රුසියාවේ ඇති වූ විප්ලවයේදී මවක් වශයෙන් කාන්තාවගේ භූමිකාව නිරූපණය කරන නවකතාවකි.
   කතෘ - මැක්සම් ගෝර්කි

<u>ඉන්දියානු සාහිත්‍ය නිර්මාණ</u>

1. ගීතාංජලී - බෙංගාලි බසින් රචිත කාව්‍ය ග්‍රන්ථයකි
   කතෘ - රවින්ද්‍රනාත් තාගෝර්
   මෙම කෘතිය සඳහා 1913 වසරේදී තාගෝර් තුමන් හට නොබෙල් සාහිත්‍ය ත්‍යාගය හිමිවිය.

2. Malgudi Days (මල්ගුඩි දවස්) - කතෘ - ආර්.කේ. නාරායන්
   ඉන්දයාවේ මල්ගුඩි නගරය පාදක කොටගෙන රචනා වී ඇති කෙටිකතා එකතුවකි.

3. Swami and Friends - කතෘ - ආර්.කේ. නාරායන්

4. Letters From Father to his daughter (පියෙකුගෙන් තම දියණියට ලියූ ලිපි) - කතෘ - ජවහර්ලාල් නේරු

**ඉංග්‍රීසි සාහිත්‍ය නිර්මාණ**

| | |
|---|---|
| මැක්බත්<br>හැම්ලට්<br>ඔතෙලෝ<br>මර්චන්ට් ඔෆ් වෙනීස් | විලියම් ෂේක්ස්පියර් විසින් රචිත නාට්‍ය නිර්මාණ වේ. |

ඔලිවර් ටුවිස්ට් - චාර්ල්ස් ඩිකන්ස්

ඩේවිඩ් කොපර්ෆීල්ඩ් - චාර්ල්ස් ඩිකන්ස්

කැන්ටබරි ටේල්ස් - ජෙෆ්රි චෝසර්

ජේන් අයර් - එමලි බ්‍රොන්ටේ

**ජපන් සාහිත්‍ය නිර්මාණ**

රෂෝමන් - කතෘ රියුනොසුකෙ අකුතගවා
එදිරිවීර සරත්චන්ද්‍රයන් 'මනමේ' නාටකය සඳහා පාදක කරගත් කෘතියකි.

කොකොරෝ - කතෘ: නත්සුමෙ සෝසෙකි
'හදවත' යනුවෙන් සිංහලට පරිවර්තනය කර ඇත.

යුකිගුනි - කතෘ: යසුනරි කවබතා
'හිමබිම' යනුවෙන් සිංහලට පරිවර්තනය කර ඇත.

**විශ්ව සාහිත්‍යයේ එන කියමන්**

විශ්වය නිර්මාණය වී ඇත්තේ හිරුගේ රැස් වලින් හා මවගේ කිරි වලිනි.
'අම්මා' නවකතාව
මැක්සිම් ගෝර්කි

ජීවිතය රඟ මඩලකි. අප එහි රඟන නළුවෝ වෙමු.
'මැක්බත්' නාට්‍යය
විලියම් ෂේක්ස්පියර්

මව් ගුණය ඇත්තෝ දරුවන් ලැබිය යුත්තෝ
'The Caucasian Chalk Circle'
හුණුවටයේ කතාව
බටෝල්ට් බ්‍රෙෂ්ට්